# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

කර්මාන්ත අමාත්‍යාංශය

# මිල කැඳවීමයි

**<u>කොළඹ නගර සීමාව තුල කාර්යාල ගොඩනැගිල්ලක් වසර 02 ක් සඳහා කුලියට හෝ බද්දට ගැනීමට</u>**
**<u>ලංසු අංකය NGJA/18/57 - 2023</u>**

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ, ප්‍රධාන කාර්යාලය ලෙස භාවිතා කිරීමට සුදුසු කොළඹ නගර සීමාව ඇතුලත ප්‍රධාන පාරකට මුහුණලා හෝ ආසන්නව, වාහන 25 ක් පමණ ගාල්කර තැබිය හැකි ජලය, විදුලිය හා ජලාපවහන පහසුකම් සහිත වර්ග අඩි 25000-32000 ක පමණ ගොඩනැගිල්ලක් කුලියට හෝ බද්දට ගැනීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

**කොන්දේසි**

(i) ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදයට අනුකූලව ප්‍රසම්පාදනය සිදු කෙරේ. (NCB)

| විස්තරය | මුදල / දිනය |
|---|---|
| ආපසු ගෙවනු නොලබන ලේඛණ ගාස්තුව | රු.12,500.00+2.5%SSCL +15%VAT |
| බැංකු ඇපකරයේ වටිනාකම | රු. 1,000,000.00 |
| ලංසු පත්‍රිකා බාර ගන්නා අවසන් දිනය / වේලාව | 2023.08.25 ප.ව. 02.00 |
| ලංසු පත්‍රිකා විවෘත කිරීම | 2023.08.25 ප.ව. 02.15 |

(ii) ආපසු ගෙවෙනු නොලබන රු.12,500.00 +2.5%SSCL (රු.312.50) +15% VAT (රු.1,921.87) (මුළු මුදල - රු.14,734.37), මුදලක් **කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය,** "මැක්සන්ස් ටවර්", අංක 12, හි පිහිටි ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසුව සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර ලංසු පත්‍රිකා සහ අදාල කොන්දේසි 2023.08.04 වන දින සිට 2023.08.24 දින දක්වා වැඩ කරන දිනයන් වලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුල ලබා ගත හැකිය.

(iii) පරිශ්‍රයේ අයිතිකරුවන් පමණක් තමාගේ මිල ගනන් ඉදිරිපත් කල යුතු අතර, ඔප්පු මහ නගර සභාවේ අනුමත පිඹුරු පිටපත් සහ අනුමත ගොඩනැගිලි සැලැස්ම සහිත අපේක්ෂිත බදු මුදල සහ කොන්දේසි ඇතුළු සියලු විස්තර ලංසු පත්‍රිකා වල අඩංගු කල යුතුය.

(iv) මුද්‍රා තබන ලද අයදුම්පත් 2023.08.25 වන දින ප.ව 2.00 ට හෝ ඊට ප්‍රථම, සභාපති - ප්‍රසම්පාදන කමිටුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, අංක 12, "මැක්සන්ස් ටවර්" **ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය,** කොළඹ 03, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ 4 වන මහලෙහි සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවර **"ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රධාන කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට/ බද්දට මිලදී ගැනීම- 2023"** යනුවෙන් සඳහන් කල යුතුයි.

(v) මුද්‍රා තබන ලද අයදුම්පත් සමග අවම දින 119 කාලයක් වලංගු රු. 1,000,000.00 ක වටිනාකමින් යුත් වාණිජ බැංකුවකින් ලබා ගත් බැංකු ඇපකරයක් ඉදිරිපත් කල යුතුය. (2023.08.25 සිට 2023.12.21 දක්වා)

(vi) ලංසුපත් විවෘත කිරීම ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි 7 වන මහල, ශ්‍රවනාගාරයේදී 2023.08.25 වන දින ප.ව 2.15 ට සිදු කරන අතර ප.ව. 2.00 ට පසුව ලැබෙන ලංසු පත්‍රිකා විවෘත කිරීමකින් තොරව අවලංගු කරනු ලැබේ. එම විවෘත කිරීම සඳහා ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

වැඩි විස්තර සඳහා -

සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - 071536 2 536


**සභාපති - ප්‍රසම්පාදන කමිටුව**

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

අංක **12,** "මැක්සන්ස් ටවර්"**, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, කොළඹ 03**.

දුරකථන **:** 0112-329 295, 2 325 364, 2 390 645-8 ෆැක්ස් **:** 0112-320 758, 011-2 332 197

වෙබ් අඩවිය **: www.ngja.gov.lk**